## වැරදි මෝස්තරේ

**න**ගරයේ සාප්පුවක් බිඳ සාරියක් සොරකම්කිරීමේ වරදට උසාවියට ඉදිරිපත් කර සිටි විත්තිකරුගෙන් විනිශ්චය කාරවරයා ප්‍රශ්න ඇසී ය.

**විනිසුරු :** යුෂ්මතා පිළිගන්නවද මේ සාප්පුවට ඇතුල්වෙලා සාරියක් හොරකම් කළ බවට....?

**විත්තිකරු :** එහෙමයි හාමුදුරු වනේ.....

**විනිසුරු :** මට දැන ගන්න ලැබුණා යුෂ්මතා මේ සාප්පුවම ඊට කලින් දවසෙත් බින්දයි කියලා.....

**විත්තිකරු :** ඒක වුනේ මෙහෙමයි හාමුදුරු වනේ..... අරන් ගිය සාරියෙ මෝස්තරේට අපේ ගෑණී කැමති වුනේ නෑ..... ඉතින් මට ආයිමත් එන්න සිද්ධවුනා.....

## වෙනස

**ප්‍රශ්නය :** පෙරදිග බිරිඳක හා බටහිර බිරිඳක අතර ඇති වෙනස කුමක්ද?

**පිළිතුර :** පෙරදිග බිරිඳට විවාහයට පෙර සැමියා දකින්නට නැත. බටහිර බිරිඳට විවාහයෙන් පසු සැමියා දකින්නට නැත.

## හොඳ දත්පෙළක් සඳහා වෛද්‍ය උපදෙස්

*ඇමරිකාවේ සුප්‍රකට දන්ත වෛද්‍ය මණ්ඩලයක් මගින් පහත සඳහන් උපදෙස් මාලාව ලොවපුරා යවා ඇත.*

1. දවසට දෙවරක් කෑමට පසු නොවරදවා දත් මදින්න.
2. වසරකට දෙවරක් දත් දොස්තර මහතා හමුවන්න.
3. අනුන්ගේ දේවල් වලට කට නොදාන්න.



## අපූරු තාත්තා

**මැ**දිවියේ මිනිසෙකු වයස පහක තරමේ පිරිමි ළමයෙකු සමග නගරයේ බාබර් සාප්පුවට ඇතුල් විය. බාබර් පළමුව මිනිසාගේ කොණ්ඩය කැපීය. කපා අවසන් වූ පසු මිනිසා ළමයා ඔසවා පුටුවේ තබා–

" එහෙනම් පුතා දැන් කොණ්ඩෙ කපා ගන්න. මම අර එළියෙ කඩේට ගිහින් පත්තරයක් අර ගෙන ඉක්මනට එන්නම් " කියා පිටවී ගියේ ය.

ළමයාගේ කොණ්ඩය කපා අවසන් වූ නමුත් මිනිසා ආවේ නැත.

" මොකද දන්නෙ නෑ ඔය ළමයගෙ තාත්තා තවම ආවෙ නැත්තෙ.... දැන් ගිහිල්ලා හුඟක් වෙලා නේද..... ? " බාබර් ළමයාගෙන් ඇසීය.

" එයා මගේ තාත්තා නෙවෙයි...." ළමයා පිළිතුරු දුන්නේය.

" තාත්තා නෙවෙයි ? එහෙනම් ඒ කවුද? "

" මම දන්නෙ නෑ ඒ කවුද කියලා...... මේ සාප්පුව ඉස්සරහින් මම පාරෙ යනකොට මගේ අතින් අල්ලගෙන..... 'යං පුතා අපිට මෙතනින් නිකම් කොණ්ඩෙ කපා ගන්න පුළුවන්' කියලා.... ඒ එක්කෙනා මගේ අතින් ඇදගෙන මේ සාප්පුව ඇතුළට ආවා......"

## නූල මට බඳින්න

**කට්ටඩි තැන -** හරි හරි ඉතින් කවුද හීනෙන් කෑගහන්නෙ....?

**අමුත්තා -** මගේ හාමිනේ තමයි කට්ටඩි මහත්තෙයො.....

**කට්ටඩි තැන -** ඉතින් ඒකට ඔහේට නූල් බැඳලා හරි යන්නෙ නෑ නේ..... හාමිනේට බඳිමු.....

**අමුත්තා -** එයාට ඕන නෑ..... මොකද ඒ කෑ ගැහිල්ලට හාමිනේ නොවෙයි බය වෙන්නෙ.... මම....!

## රැවටෙනවට බයයි!

**බිරිඳ :** ඔයාට ආයෙමත් අර අමතකවන ලෙඩේ හැදිලා නේද?

**සැමියා :** අපොයි නෑ හාමිනේ මට දැන් හොඳටම සනීපයි.......

**බිරිඳ :** එහෙනම් මොකද දැන් සෑහෙන වෙලාවක ඉඳන් කණ්ණාඩිය දිහා බලාගෙන කල්පනා කරන්නෙ.......?

**සැමියා :** නෑ හාමිනේ මේ කණ්ණාඩියෙ ඉන්න හාදයගෙ මූණත් හරියටම මගේ මූණ වගේමයි....... මං මේ කල්පනා කෙරුවෙ ඔයා මං කියලා හිතලා ඌට රැවටෙයිද කියලා.......

## ඉහළ නැගීම

**තැ**බෑරුමට වැදුණු දෙදෙන පදමට වෙරිවී කතාවට වැටුණෝ ය. දෙදෙන මූණ ගැහුණු පළමු දිනය ද එය විය.

**පළමුවැන්නා** – මම පහළම තැනින් පටන් අරගෙන ඉහළම තැනට නැග්ග මිනිහෙක්..........

**දෙවැන්නා** – ෂහ්..මරුනේ....ඒ කොහොමද මචං........?

**පළමුවැන්නා** – ඉස්සර මං කුලියට සපත්තු පොලිෂ් කළා....... මං දැන් බාබර් සාප්පුවක කොණ්ඩෙ කපනවා............

*ලංකා විත්ති පුවත්පතේ පළවන ලිපි අදහස් හා දැන්වීම් ඒවා පළකරන අයගේය. ඒ පිළිබඳව කර්තෘගේ කිසිදු වගකීමක් නැත.*

*ලංකාවිත්ති පත්‍රය අවුරුද්දක් ඔබේ ගෙදරට ගෙන්වාගන්නට පවුම් 12 ක චෙක්පතක් Lanka Viththi යනුවෙන් ලියා පහත සඳහන් ලිපිනයට එවන්න.*

**Lanka Viththi**
**P. O. Box 64678,**
**London NW3 9LS**



*නියම ගාම්භීර පොලිස්කාර පෙනුම විදහා දක්වමින්.......*

**He is tipped to become the Police Chief there.**

*තායිලන්තයේ පොලිස්පති ධුරයට පවා මේ වඳුරු රාළහාමි පත්විය හැකියයි තතු දන්නෝ කියති.*



**Santisuk, the monkey cop, is helping win hearts in Thailand. Photos : Reuters / Damir Sagolj**

# Thailand's Monkey Police
# තායිලන්තයේ වඳුරු පොලිස්

This is not fiction. It's true- a monkey named Santisuk is now working for Thailand Police Force as a cop. The 5 year old monkey was discovered with a broken arm last year and nursed back to health at a local clinic. But when no one arrived to claim him, Thai police adopted him as one of their own and began enlisting his charm at roadside checkpoints to help ease tensions with the community.

According to the UK Daily Mail, the macaque leads a fairly charmed life of greeting passing motorists and helping locals collect hard-to-reach coconuts.

In fact, the first " Monkey Police" has become something of a celebrity among the region's predominantly Muslim community. Tensions have run high in the past, but the monkey, named Santisuk, is helping to change that, so says Police Corporal Yutthapol.

Other officers deal with annoyed drivers. With Santisuk the checkpoint is a happy place. Locals, once annoyed with the police, now like to have their picture taken with the newest member of the force.

Thailand has been the site of often violent clashes between separatists and the nation's Muslim and Buddhist communities, but with the success of Santisuk's ambassadorship, Thai officials are hoping to enlist more Monkey Police, reports The Nation.

**මෙ**ය කිසිසේත් ප්‍රබන්ධයක් නොවේ. තායිලන්තයේ පොලිස් දෙපාර්තමේන්තුවට අලුතෙන්ම බඳවා ගත් නිලධාරියා සන්තිසුක් නමැති වඳුරාය. පොලිස් ඇඳුමෙන් සැරසී අනෙක් නිලධාරීන් සමග ජීප් රථයෙන් මාර්ගවල සෙනග අතරට ගොස් ඔහු රාජකාරියේ යෙදෙයි.

තායිලන්තයේ මේ මෑතක නිතර පැවති මුස්ලිම් බෞද්ධ ගැටුම් වලට පසු බහුතර මුස්ලිමුන් වෙසෙන පළාත්වල ඇතිව තිබූ නොසන්සුන්තාව මේ වඳුරා නිසා නැතිවීයයි පොලිසිය කියයි. කලින් පොලීසිය නොරිස්සූ මුස්ලිම් ජනතාව දැන් සන්තිසුක් සමග පෙටෝ ගන්නටද, පොලීසිය කෙරෙහි ප්‍රසන්නව බලන්නටද පුරුදු වී ඇතැයි පොලිසිය පවසයි.

අවුරුදු 5 ක් වයසැති මේ වඳුරා ගිය වසරේ හමුවූයේ බිඳුණු අතක් සමගය. ඒ පළාතේ වෛද්‍ය මධ්‍යස්ථානයකට ගෙන ගොස් ඌට බෙහෙත්කර සුව පත්වූ නමුත් වඳුරා බාරගන්නට කෙනෙකු ආවේ නැත. පොලිසිය ඌ රැගෙන ආවේය.

සන්තුසික් ඉතා ආශාවෙන් අනෙක් පොලිස් නිළධාරීන් සමග ජීප්රථයෙන් නිළසංචාරයන්ට එක්වෙයි. වාහන තදබද පරීක්ෂාකරන්නට යයි. ජනතාවට ඉතා ආචාරශීලීව ප්‍රතිචාර දක්වයි. තමා සන්තුසික් ගැන සෑහීමට පත්ව සිටින බවත් තවත් වඳුරන් පොලිස් සේවයට බඳවා ගන්නට අදහස් කරන බවත් තායි පොලිස් ප්‍රධානී යූතාපොල් පැවසී ය.


**Domestic Part P & BS7671 Qualified**
**Professional Electrical Engineer**
**All electrical work carried out**
**Testing-Inspecting and Certification of all work**
**All jobs undertaken with guarentee**
**NICEIC Certificate**
ගෘහස්ත සියළු විදුලි කාර්මික කටයුතු සඳහා
ප්‍රවීන විදුලි ඉන්ජිනේරු ශිල්පී සේවය
**Call - රන්ජිත් Ranjith on 07846764560**

**ලිහිණියා LIHINIYA**
ශ්‍රීලංකා අවන්හල සහ වෙළඳසල
*ප්‍රණීත ආහාර සැපයීමේ පුරෝගාමියෝ*
එවලේම පිළියෙල කරන ආප්ප, ඉඳිආප්ප
පිට්ටු, රොටි කොත්තු, බුරියානි
*උත්සව සඳහා ඇණවුම් බාරගනු ලැබේ.*
කුළුබඩු වර්ග ඇතුළු විවිධ ශ්‍රීලංකා නිශ්පාදන
*ලිහිණියා විශේෂ නිශ්පාදනයක් වන*
බැදපු සහ අමු තුනපහ දැන් ඉතා ජනප්‍රියයි
Tel. 0208 450 9052
66 Cricklewood Broadway, London NW2 3EP

වසර ගණනාවක් පුරා ශ්‍රීලාංකික ජනතාවගේ හදවතට
වඩාත් සමීපව කටයුතු කරන නැව් බඩු ආයතනයයි
**සත්සමුදුර ජයගත් ට්‍රයිකෝ**
♦ ට්‍රයිකෝ - කොළඹ
50 සිරිල් සී පෙරේරා මාවත
කොළඹ 13
දුරකතනය 448270 /432236
♦ ට්‍රයිකෝ - ගාල්ල ♦ ට්‍රයිකෝ - කුරුණෑගල
සතියක් ඇර සතියක්, එනම් මසකට දෙවරක්
ට්‍රයිකෝ නැව්බඩු ලංකාවට යැවේ.
දින 17 කින් ඒවා ලංකාවට ළඟාවේ.
**TRICO**
**Shipping & Forwarding Ltd**
**555 White Hart Lane**
**London N17 7RP**
Telephone 0208 888 8787
Fax 0208 889 5445
E-Mail : trico@tricoshipping.com
*නැව්බඩු සඳහා පූර්ණ විශ්වාසය තැබිය හැකි ආයතනය*

**SHANTHI & CO** ❊❊❊❊❊
Solicitors & Commissioners for Oaths
**We are an established law firm in North London**
Specialising in Immigration matters ( Visas, **Tier 1** General - Highly Skilled Migrants / **Tier 2** Skilled Workers (WorkPermits), Students, Domestic Workers, Appeals - Judicial Reviews etc.)
♦ Residential / Commercial Conveyancing
♦ Landlord and Tenant Disputes ♦ Divorce ♦ Employment Law
♦ General Litigation ( Sale of Goods, Services, Debts etc.)
♦ We offer comprehensive services on legal maters in Sri Lanka
***Contact*:- Shanthi Senadheera (*Solicitor*) Padmini Senadheera (*Solicitor*) Dinu Senadheera (*Solicitor*)**
206 Seven Sisters Road, Finsbury Park, London N43NX
Tel. 020 7561 9494 Fax 020 7561 9495
Emergency: 07956 129 642 shanthi.co@btconnect.com